කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

2026 නොවැම්බර් මස 03 දිනය සඳහා කාලගුණ අනාවැකිය
2026 නොවැම්බර් මස 02 දින ප.ව. 2.00 ට නිකුත් කරන ලදී

උතුරුමැද, වයඹ, මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණු පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් පස්වරු 1.00 න් පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. ඇතැම් ස්ථාන වලට **මි.මී. 75 ට වැඩි තරමක තද වැසි** ඇති විය හැක.

දකුණු පළාතේ සහ අම්පාර දිස්ත්‍රික්කයේ උදැසන කාලයේදීත් වැසි ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වලත් ඇතැම් ස්ථානවල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

WEATHER FORECAST FOR 03 November 2026
Issued at 2.00 p.m. on 02 November 2026

Showers or thundershowers will occur at several places in North-central, North-western, Central, Uva, Sabaragamuwa and Sothern provinces and in Trincomalee district. Fairly **heavy falls above 75 mm** are likely at some places in these areas.

Showers may occur in the Southern province and Ampara district during the morning too.

The general public is kindly requested to take adequate precautions to minimize damage caused by temporary localized strong winds and lightning during thundershowers.

Misty conditions can be expected at some places in Sabaragamuwa, Central and Uva provinces during the early hours of the morning.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2026 නොවැම්බර් මස 02 දින ප.ව. 2.00 ට නිකුත් කරන ලදී

බටහිර-මධ්‍යම සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "මුරාසු" (Murasu) සුළි කුණාටුව, ප්‍රබල සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. 2026 නොවැම්බර් 02 වැනි දින උදෑසන 08.30 වන විට, මෙම පද්ධතිය උතුරු අක්ෂාංශ 14.1° සහ නැගෙනහිර දේශාංශ 81.4° ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුණි.

මෙම "මුරාසු" ප්‍රබල සුළි කුණාටුව වයඹ දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, නොවැම්බර් මස 02 දින මධ්‍යම රාත්‍රිය සහ 03 දින අළුයම් කාලය පමණ වන විට ආන්ද්‍රා ප්‍රදේශ් වෙරළ හරහා ඉන්දියානු ගොඩබිම වෙත ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

<u>එමනිසා උතුරු අක්ෂාංශ 10 ත් 17 ත් සහ නැගෙනහිර දේශාංශ 80 ත් 85 ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.</u>

<u>එසේම මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා ගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙසත් දැනුම් දෙනු ලැබේ.</u>

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වැසි තත්ත්වය:

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සුළඟ:

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත හෝ දකුණු දෙසින් හමන අතර සුළඟේ වේගය **පැ.කි.මී. (25-35)** පමණ වේ. **හලාවත සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (40-45) දක්වා ඉහළ යා හැක.**

මුහුදේ ස්වභාවය:

හලාවත මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් **රළු විය හැක.** දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං (පැ.කි.මී. 60-70) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
GENERAL WEATHER FORECAST FOR SRI LANKA
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
Issued at 2.00 p.m. on 02 November 2026

The cyclonic storm "Murasu" has intensified into a Severe Cyclonic storm over the West central & adjoining Southwest Bay of Bengal. The system was located near latitude 14.1°N and longitude 81.4°E at 8.30 a.m. on 02 November 2026.

The Severe Cyclone "Murasu" is very likely to move northwestwards and cross south Andhra Pradesh coast during midnight of 2nd to early hours of 3rd November, 2026.

Therefore, Naval and fishing communities are warned not to venture to the deep-sea areas bounded by 10N-17N and 80E-85E until further notice. Further, Naval and fishing communities operating in those sea areas are advised to move to safe areas.

Furthermore, naval and fishing communities are advised not to venture into the deep sea areas extending from Mannar to Trincomalee via Kankasanthurai until further notice.

The naval and fishing communities, are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regard.

Condition of Rain:

Showers or thundershowers will occur at several places in the sea areas around the island.

Winds:

Winds will be South-westerly or Southerly in the sea areas around the island. Wind speed will be **(25-35) kmph.** Wind speed can increase up to **(40-45) kmph at times** in the sea areas extending from **Chilaw to Trincomalee via Mannar and Kankasanthurai.**

State of Sea:

The sea areas extending from **Chilaw to Trincomalee via Mannar and Kankasanthurai may** be fairly **rough at times**. Other sea areas around the island will be moderate.

Temporarily strong gusty winds (60-70 kmph) and very rough seas can be expected during thundershowers.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි